**ශීර්ෂය 432 උක්, බඩඉරිඟු, කජු, ගම්මිරිස්, කුරුඳු, කරාබුනැටි, බුලත් ඇතුළු කුඩා වැවිලි භෝග වගා සංවර්ධනය, ආශ්‍රිත කර්මාන්ත හා අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

උක්, බඩඉරිඟු, කජු, ගම්මිරිස් කරාබුනැටි, බුලත් ඇතුළු කුඩා වැවිලි භෝග වගා සංවර්ධනය, ආශ්‍රිත කර්මාන්ත හා අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ 2021දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව උක්, බඩඉරිඟු, කජු, ගම්මිරිස් කරාබුනැටි, බුලත් ඇතුළු කුඩා වැවිලි භෝග වගා සංවර්ධනය, ආශ්‍රිත කර්මාන්ත හා අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයයේමූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 ජූනි 17 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 ඔක්තෝබර් 26 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

2021 දෙසැම්බර් 31 දිනට උක්, බඩඉරිඟු, කජු, ගම්මිරිස් කරාබුනැටි, බුලත් ඇතුළු කුඩා වැවිලි භෝග වගා සංවර්ධනය, ආශ්‍රිත කර්මාන්ත හා අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේමූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

---

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 **මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම**

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදිම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරිම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මම ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට ,

(ආ) මෙම වාර්තාවේ ඡේද අංක 3.2 මගින් දක්වා ඇති නිරීක්ෂණ සම්බන්ධයෙන් ඉකුත් වර්ෂයේදී මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

**2. මූල්‍ය සමාලෝචනය**

---

**2.1 වියදම් කළමනාකරණය**

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | **විගණන නිරීක්ෂණය** | **ප්‍රධානගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වැය විෂයයන් 10 ක් සඳහා සලසා තිබුණු එකතුව රු.48,579,000ක ප්‍රතිපාදන වලින් එකතුව රු.17,362,760 ක ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණු අතර එහි ප්‍රතිශතය සියයට 21 ක සිට සියයට 100 ක් දක්වා පරාසයක් ගෙන තිබුණි. | නිරීක්ෂණ පිළිගනිමි. | ලබාදී ඇති පරිදි ප්‍රතිපාදන සම්පූර්ණයෙන්ම උපයෝජනය කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන වැය විෂයයන් 07 ක් සඳහා සලසා තිබුණු එකතුව රු.891,200,000 ක ප්‍රතිපාදනවලින් එකතුව රු.328,687,085 ක ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණු අතර එහි ප්‍රතිශතය සියයට 29 ක සිට සියයට 100 ක් දක්වා පරාසයක් ගෙන තිබුණි. | නිරීක්ෂණ පිළිගනිමි. | ප්‍රාග්ධන වැය විෂයයන් සඳහා සලසා තිබුණු ප්‍රතිපාදන සම්පූර්ණයෙන්ම උපයෝජනය කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ කුඩා වැවිලි බෝග සංවර්ධනය සඳහා වූ විශේෂ වැඩ සටහන සහ අපනයන කෘෂි ගම්මාන සඳහා විසිරි ජල සම්පාදනය යන සංවර්ධන උප ව්‍යාපෘති 02 ක් සඳහා සලසා තිබුණු රු.275,000,000 ක පරිපූරක ප්‍රතිපාදනවලින් රු.177,357,357 ක් හෙවත් සියයට 40 ක සියයට 84 ක් අතර ප්‍රමාණයක් ඉතිරිව පැවතිණි.ඒ අනුව අදාළ කාර්යයන් සැලසුම් කළ පරිදි වර්ෂය තුළදී අවසන් කර ගැනීමට නොහැකිව තිබුණි. | නිරීක්ෂණ පිළිගනිමි. අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අදාල සංවර්ධන උප ව්‍යාපෘති 02 සඳහා රු. මිලියන 275ක පරිපූරක ප්‍රතිපාදන ලබාදුන්නද, අදාළ භෞතික ක්‍රියාකාරකම් සඳහා ගෙවීමට ප්‍රමාණවත් අක්මුදල් නොලැබීම හේතුවෙන් විගණන විමසුමේ දක්වා ඇති පරිදි ප්‍රමාණවත් මූල්‍ය ප්‍රගතියක් ලබා ගැනීමට නොහැකි විය. | පරිපූරක වැය විෂයයන් සඳහා සලසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය සඳහා වසර ආරම්භයේ සිට ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව කටයුතු කළ යුතුය. . |

## 3. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

### 3.1 මුදල් නිදහස්කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති

------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධානගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කුඩා වැවිලි බෝග සංවර්ධනය සඳහා වූ විශේෂ වැඩ සටහන යටතේ කහ සහ ඉඟුරු වගා ප්‍රවර්ධනයට වාර්ෂික අයවැයෙන් රු.50,000,000 ක්ද 2021 පෙබරවාරි 29 දින පරිපූරක ඇස්තමේන්තුවක් මගින් තවත් රු.125,000,000 ක් වශයෙන් රු.175,000,000 ක් රාජ්‍ය අමාත්‍යාංශය වෙත ලැබී තිබුණි.මෙම මුදලින් කහ බඳුන් පැළ 11,500,000 ක් බෙදාදීමට, කහ බීජ උද්‍යාන හෙක්ටයාර 30 ක වගාකිරීමටද සහ ඉඟුරු පැළ 1,000,000 ක් බෙදාදීමට අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට රු.168,000,000 ක ප්‍රතිපාදන ලබාදී තිබුණි.ඒ අනුව සමාලෝචිත වර්ෂය තුළ කහ බඳුන් පැළ 4,847,763 ක් සහ ඉඟුරු පැළ 114,574 ක් පමණක් බෙදාදී තිබුණු අතර, කහ බීජ උද්‍යාන 04 ක හෙක්ටයාර 8.9 ක (අක්කර 22) කහ පැළ වගාකර ඒ සඳහා රු.74,395,155 ක් පමණක් වියදම් කර තිබුණි. | නිරීක්ෂණය පිළිගනිමි. කහ හා ඉගුරු පැළ බෙදා දීමේදී ප්‍රාදේශිය සංවර්ධන කමිටු, දිස්ත්‍රික් සංවර්ධන කමිටු සභාපතිවරුන් සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සහ ඇමතිවරුන් සම්බන්ධ වූ බව අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව අප වෙත දන්වා ඇත. මහජන නියෝජිතයින් සම්බන්ධීකරණයෙන් පැළ බෙදා දීමේදී සිදු වූ ප්‍රමාදයන් හේතුවෙන් පැළ බෙදා දීම මන්දගාමී ස්වභාවයකින් සිදු වූ බවත් එබැවින් නිෂ්පාදනය කළ පැළවලින් කොටසක් අධි වර්ධනය වීම හේතුවෙන් විනාශ වීම හා ඉතිරිව තිබූ පැළ, පැළ තවාන් හිමියන් විසින් අලෙවි කිරීමට කටයුතු කිරීම හේතුවෙන් කහ පැළ බෙදා දීම, පැළ 4,847,763 කටත් ඉගුරු පැළ බෙදා දීම පැළ 114,574 කටත් සීමා කිරිමට සිදු වූ බව. | ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීමේ හැකියාව සලකා බලා ව්‍යාපෘති සැලසුම් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | අපනයන කෘෂි ගම්මාන කහ බීජ පැළ තවාන් 100 ක විසිරි ජල සම්පාදනය වෙනුවෙන් රු.150,000,000 ක් 2021 මාර්තු 29 දින පරිපූරක ඇස්තමේන්තුවක් මගින් රාජ්‍ය අමාත්‍යාංශය වෙත ලැබී තිබුණි. මෙම පරිපූරක ඇස්තමේන්තු ප්‍රතිපාදනයෙන් රු.30,000,000 ක් අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට ප්‍රතිපාදනය කර තිබුණු අතර මාතලේ දිස්ත්‍රික්කයේ පැළ තවාන් 03 ක් සහ දෙපාර්තමේන්තුවට අයත් පැළ තවාන් සඳහා විසිරි ජල සම්පාදනය සඳහා රු.10,**773,**487 ක් දෙපාර්තමේන්තුව විසින් ගෙවා තිබුණු අතර අමාත්‍යාංශය විසින් ශ්‍රී ලංකා යුධ හමුදාවේ කටුනායක සහ නිරාවිය යන ගොවිපල 02 කට ජල සම්පාදනය වෙනුවෙන් රු.12,474,000 ක මුදල් ලබාදී තිබුණි. ඒ අනුව කහ බීජ පැළ තවාන් 100 කට විසිරි ජල සම්පාදන ලබාදීමට රු.150,000,000 ක් ඉලක්ක කර තිබුණද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.126,752,512 ක් හෙවත් සියයට 84 ක් උපයෝජනය කර ගැනීමට නොහැකිවී තිබුණි. | නිරීකෂණය පිළිගනිමි. COVID - 19 වසංගත තත්ත්වය මර්දනය කිරීම සඳහා රජය අනුගමනය කළ ක්‍රමවේදයන් හා සමගාමීව රාජ්‍ය නිලධාරීන් කාර්යාල වෙත කැඳවීම, රැස්වීම් වැඩමුළු පැවැත්වීම, ප්‍රවාහන කටයුතු සීමා කිරීම හා ලංසුකරුවන් මිල ගණන් ඉදිරිපත් නොකිරීම ආදියද මුදල් උපයෝජනය නොකිරීමට බලපෑ බව තව දුරටත් දන්වා සිටිමි. | ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීමේ හැකියාව සලකා බලා ව්‍යාපෘති සැලසුම් කළ යුතුය. |
| (ඇ) | අපනයන කෘෂිකර්ම ක්ෂේත්‍රයේ සැකසුම්කරණය හා අගය එකතුකිරීම - ගාල්ල ඇල්පිටිය කෘෂි අපනයන නිෂ්පාදන හා සැකසුම් කලාපය ස්ථාපිත කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේ රාජ්‍ය අමාත්‍යාංශයට අයවැය ඇස්තමේන්තුවෙන් රු.65,000,000 ක්ද, 2021 මාර්තු 23 දින පරිපූරක ඇස්තමේන්තුව මගින් රු.200,000,000 ක් වශයෙන් රු.265,000,000 ක් ලැබී තිබුණි. මෙම කලාපය සඳහා අක්කර 64 ක භූමි ප්‍රමාණයක් සහ බිම් කොටස් ලබාදීමට අනුමත කර ගත් කෘෂි ව්‍යවසායකයන් 14 දෙනෙකු තෝරා ගෙන තිබුණි. 2021 දෙසැම්බර් 31 දින වන විටත් එම ව්‍යවසායකයින් සමඟ ගිවිසුම් ගත වී | නිරීක්ෂණය පිළිගනිමි. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂම් සභාවට අයත් ඇල්පිටිය මහහීන්තැන්න ප්‍රදේශයේ පිහිටි අක්කර 64 ක ඉඩම මැණුම් කටයුතු සිදුකර ආයෝජකයින් 14 දෙනෙකු සඳහා ඉඩම් කොටස් වෙන්කර මායිම් ලකුණු කර ඇත. මෙම කලාපයේ ආයෝජනය කිරීමේ කැමැත්ත හා ඉදිරි වැඩ පිළිවෙල අමාත්‍යාංශය විසින් ආයෝජකයන්ගෙන් ලිඛිතව විමසා ඇති අතර දැනට මේ සඳහා | ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීමේ හැකියාව සලකා බලා ව්‍යාපෘති සැලසුම් කළ යුතුය. |

| | |
|---|---|
| නොතිබුණු අතර එම ව්‍යවසායකයන්ට අදාළ බිම් කොටස් ලබාදීමද ආරම්භ කර නොතිබුණි. ආයෝජකයන්ගේ ඉදිකිරීම් කටයුතු පහසු කරලීම සඳහා අභ්‍යන්තර මාර්ග පද්ධතිය, විදුලිය,ජල පහසුකම් හා දුරකථන පහසුකම් ලබාදීම වෙනුවෙන් රු.262,578,115 ක් වියදම් කර තිබුණු අතර මෙම මාර්ග ඉදි කිරීම 2022 මැයි 10 දින අවසන් කල යුතු වුවත් 2022 සැප්තැම්බර් 08 දින දක්වා මෙම මාර්ගයේ වැඩ අවසන් කර නොතිබුණි. එසේම අනුමත කර ගත් කෘෂි ව්‍යවසායකයන්14 දෙනා 2022 සැප්තැම්බර් 30 දින වනවිට 06 දෙනෙකු දක්වා අඩුවී තිබුණි. | ආයෝජකයන් 07 දෙනෙකු කැමැත්ත ප්‍රකාශ කර ඇත. රටේ පැවති ඉන්ධන සපයාගැනීමේ අර්බුදය හා අමුද්‍රව්‍ය ලබාගැනීමේ අපහසුතාවය හේතුවෙන් අභ්‍යන්තර මාර්ගයේ ඉදිකිරීමේ කටයුතු නිමකිරීමට කොන්ත්‍රාත්සමාගම එකඟවී ඇත. |

**3.2 පාඩු හා හානි**

| **විගණන නිරීක්ෂණය** | **ප්‍රධානගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| පළාත් සභා , පළාත් පාලන හා ක්‍රීඩාඅමාත්‍යාංශය වෙතින් 2018 ජුනි 13 දින ලැබී තිබුණු **KC** 5500 මෝටර් රථය 2018 අගෝස්තු 24 දින අනතුරකට පත්ව තිබුණි. මෙම රථය අමාත්‍යාංශය වෙත පවරාගෙන නොතිබුණු අතර අනතුරින් රු.6,783,254 ක අලාභයක් සිදු වී තිබුණද එය මෙතෙක් වගකිවයුතු පාර්ශවයෙන් අයකර ගැනිමට කටයුතු කර නොතිබුණි. මෙම මෝටර් රථය කල් ඉකුත් වූ රක්ෂණ බලපත්‍රයක් සහිතව ධාවනය කර ඇති නිසා අනතුර සිදුවීමෙන් ඇති වූ පාඩුව රක්ෂණ ආයතනය මඟින් ද ආවරණය කර ගැනීමට නොහැකිව තිබුණි. | එම අනතුර සිදුවන අවස්ථාවේ එහි රක්ෂණය අවලංගු වී තිබුණු බැවින් රක්ෂණ වන්දි ලබාගැනීමට හැකියාවක් නොතිබූ බැවින් අදාළ නිලධාරියාගෙන් එම වන්දිය ලබාගැනීමට කටයුතු කරනු ඇත. | වගකිවයුතු නිලධාරීන්ගෙන් අලාභ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.3** කළමනාකරණ දුර්වලතා

| විගණන නිරීක්ෂණය | ප්‍රධානගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| රාජ්‍ය අමාත්‍යාංශය විසින් ගම්මිරිස් වගාවේ ඵලදායීතාවය වැඩිකිරීම සඳහා රු.532,000 ක් වූ අතුකපන යන්ත්‍ර 14 ක් සමාලෝචිත වර්ෂයේදී මිලදී ගෙන තිබුණු නමුත් එම උපකරණ පුහුණු වැඩමුළුවක් පවත්වා බෙදාදීමට සැලසුම් කර ඇතත් 2022 සැප්තැම්බර් 30 දින දක්වාම බෙදාදීම ප්‍රමාද තත්ත්වයක පැවතිණි. | මිලදී ගත් උපකරණ ප්‍රමාද නොවී බෙදාදීම කළ යුතුය. | ඉන්ධන අර්බුදය නිසා පුහුණුව පැවැත්වීමට නොහැකි විය. |